

පිළිසකර වෙමින් පවතින අභයගිරිය

## බුදුරදුන් දැකීම

*– පිටිදූවේ සිරිධම්ම හිමි*

බුදුරදුන් සහ සමකාලීනව ජීවත් වූ පුද්ගලයකු අතර ඇතිවූ සංවාදයක් ඇසුරෙන් බුදුරදුන් දහම තුළින් දකගැනීමේ වැදගත්කම ධර්මානුකූල ලෙස විග්‍රහ කිරීමට දරන ලද ප්‍රයත්නයකි. වර්තමානයේ ශ්‍රී ලංකාවේ ජනප්‍රිය වෙමින් සිටින විද්වත් – ධර්ම කථික හිමි නමක් මෙම ලිපිය සප–යයි.

## භාවනාව සමාජ ගැටලුවට විසඳුමකි

*– එච්. ජී. පියසේන*

මානසික රෝග – කායික රෝග ආදිය සමනය කිරීමටත්, අන්තර් පුද්ගල සබඳතා විධිමත් වීමටත්, භාවනාවෙන් දියුණු වන සිත් ඇති මිනිසුන් සිටින සමාජයක් බිහිවීමේ අවශ්‍යතාව. සියලු දුක් නැති කිරීම පිණිස ද, මිනිසාගේ සමාජ ජීවිතය ප්‍රීතිමත් එකක් වීම පිණිස ද බෞද්ධ භාවනා ක්‍රමවල පවත්නා උපයෝගීතාව.

## බුදුරදුන් පෙන්වා වදාළ මිත්‍රත්වය

*– අත්තුඩාවේ සිරි රාහුල මහ නා හිමි*

පුද්ගලයාගේ භෞතික හා ආධ්‍යාත්මික දියුණුව සලසන කල්‍යාණමිත්‍ර සම්පතෙහි වැදගත්කම. නිවන් මග තහවුරු වීමට හෝ අධ්‍යාත්මක හා භෞතික පරිහානිය ඇතිවීමට, මිතුරු ඇසුරෙහි දයකත්වය.

## ලද උතුම් දිවියේ ඵලය වටහා ගැනීම

*– හඟවත්තේ වංගීස හිමි*

මිනිස් ජීවිත කාලය තුළ පුද්ගලයා සහජයෙන් ලද චින්තන ශක්තිය තුළින් ලද යුතු උපරිම ඵලය කුමක් ද යන්න – බුදු වදනට අනුව විමසා බැලීමට දරන ලද උත්සාහයකි. දහමට අනුව විමුක්ති සැපත තහවුරු කරගත හැකි අවම සීමාව පිළිබඳව ද මේ ලිපිය තුළ කෙටියෙන් කරුණු ඇතුළත්ව ඇත.

## පවට බිය වී පිනට යොමු වී...

*– මාකොළ මංගල හිමි*

සූත්‍ර පිටකයට අයත් ග්‍රන්ථයක් වූ පේතවත්ථුවෙහි ඇතුළත් කතා පුවත් පිළිබඳ විමසුමකි. එද සමාජය පාපයෙන් වළක්වා – නිසි මඟට යොමු කිරීමට පේතවත්ථුව වැනි ග්‍රන්ථවල ඇතුළත් කතා මගින් ඇති වූ මනෝ–විද්‍යාත්මක බලපෑම.

## අසහනයෙන් පිරී සිතට සහන් එළියක්භාවනාව

*– මඩවල උපාලි හිමි*

භාවනාව පිළිබඳ වර්තමාන සමාජයේ පවතින ඇතැම් අදහස්වල සාව–ද්‍යතාව පැහැදිලි කර දී – බෞද්ධ භාවනා ක්‍රම මගින් ගිහියාගේ ජීවිතයට ද සැනසීමක් උදකර ගත හැකි අන්දම පැහැදිලි කිරීම සඳහා වූ ප්‍රවේශ–යක් හැටියට මෙම ලිපිය හැඳින්විය හැකිය. ශ්‍රී ලංකාවේ ඉතා සුප්‍රකට භාවනා මධ්‍යස්ථානයක අධිපති තනතුර දරන විද්වත් – ධර්ම කථික හිමිනමක විසින් සපයනු ලබන මෙම ලිපියේ තවත් කොටසක් ලබන පත්‍රයේ පළවීමට නියමිතය.

## දැහැමි රටක් තැනුමට දහම් පියසට උර දෙමු

*– එම්. ඒ. ආරියසේන*

දහම් පාසල් අධ්‍යාපනය නගා සිටුවීම සඳහා ක්‍රියාත්මක කළ යුතු යැයි අදහස් කැරෙන යෝජනා කිහිපයක් ඇතුළත් කුඩා ලිපියකි. දහම් පාසල් අධ්‍යාපනයේ ප්‍රගතියක් ඇතිවීමෙන් බිහිවන යහපත් ප්‍රතිඵල පිළිබඳ පෙර විමසුමක් ද මෙම ලිපියට ඇතුළත් ය.

## 'විෂඝෝර සර්පයා අත නාරු මෝඩයා'

*– කැටවල ඉන්දසාර හිමි*

මිනිස් මනස තුළ ඇතිවන තණ්හාවේ ස්වභාවය ගැන බණ පොතෙහි දැක්වෙන උපමාවක් පිළිබඳ අර්ථ විග්‍රහයකි. නූතන සමාජයේ ඇතැම් අය අර්ථය වරදවා ගත් එම උපමාවෙහි සැබෑ අර්ථය පැහැදිලි කිරීම මෙම ලේඛකයාගේ අරමුණක් වී ඇති බව පෙනේ.

## මහ බෝසතුන් අප වෙනුවෙන් කරන ලද කටුක සසර දුක

*– අඹගම්මන ඉන්ද්‍රරතන හිමි*

බෝධිසත්වයන් වහන්සේ මුහුණ දුන් කටුක අත්දැකීම් – විමර්ශනයට ලක් කිරීමකි, මෙය. විශේෂයෙන් දුෂ්කර ක්‍රියා සමය තුළ උන්වහන්සේ අත්දුටු දැඩි දුක් සමූහය පිළිබඳ විවරණයක් මෙම ලිපියට ඇතුළත්ය.

## සදහම් දැනුම

*– වහුමුවේ විජයවංශ නා හිමි*

බුදුදහම හා ඊට අදාළ විවිධ විෂය කරුණු පිළිබඳ කෙටි ප්‍රශ්න හා පිළිතුරු මගින් පාඨකයා දැනුවත් කරන විශේෂාංගයකි. විද්වත් ලේඛක හිමිනමක් විසින් ඉදිරිපත් කරනු ලබන මෙම විශේෂාංගය – දහම හදාරන සිසුන්ට බෙහෙවින් ප්‍රයෝජනවත් විය හැකිය.

## සුරලොවට අපායට මඟ කියන මිතුරෝ

*– ආචාර්ය සිරිපාල මාදුවගේ*

මිතුරු ඇසුර පුද්ගලයාගේ දියුණුවට හා පරිහානියට බලපාන අයුරු. යහපත් මිතුරන් හා අයහපත් මිතුරන් අට දෙනකු පිළිබඳ බුදුරදුන් ඉදිරි–පත් කළ විග්‍රහයක් ද මෙම ලිපියට ඇතුළත්ය.

## හාල්දඬුවන නා හිමි

ශාසනයට ඉමහත් සේවයක් සැලසූ සහ සලසමින් සිටින ශ්‍රී ලංකාවේ සුප්‍රකට – වියත් මහ තෙරවරු කිහිප නමක් පිළිබඳ තොරතුරු ඇතුළත් ලිපි තුනකි.

## ⌘ දිනපතා තෙරුවන් වඳිමු

*– කිරිබත්ගොඩ ඤාණානන්ද හිමි*

දිනපතා තෙරුවන් නැමදීම – පුද්ගලයා ආධ්‍යාත්මික ප්‍රගති මාවතේ රඳවා තබන වැදගත් පිළිවෙතක් බව. පවුලක දූ දරුවන්ගේ සදාචාර වර්ධනය උදෙසා – හුදු නියෝග කිරීමක් වශයෙන් නොව – දරුවන් සමඟ එක්ව මවුපියන් ද තෙරුවන් නමදින පිළිවෙතෙහි නියැලීමේ වැදගත්කම.

## ⌘ අවවාදයට කිපීම අසත්පුරුෂයාගේ ලක්ෂණයයි

*– දිවියාගහ යසස්සි නා හිමි*

ජීවිතයක දියුණුව සඳහා යහපත් අවවාද උපදෙස් නිහතමානීව විමසා පිළිගැනීමේ වැදගත්කම. අවවාද නුරුස්සන අධිමානයෙන් පෙළෙන නූතන සමාජයේ බොහෝ පුද්ගලයන්ට වැදගත් ධර්මෝපදේශයක් 'සාර්ථක ජීවිතයකට ධම්මපදයෙන්' විශේෂාංගය යටතේ සුප්‍රකට – විද්වත් හිමි නමකගෙන්.

## ⌘ ශ්‍රීපාදස්ථානයෙන් තවත් සේවා රැසකට මුල

ශ්‍රීපාදස්ථානය එදා සිටම බොදු බැතිමතුන්ගේ සුවිශේෂ ආධාර උපකාර ලබන ස්ථානයකි. එවන් ස්ථානයක එක්රැස් වන ධනයෙන් – ශාසනික හෝ සාමාජික වශයෙන් ඉටු වූ හා ඉටුවන සේවා පිළිබඳ දැනගැනීමට පොදු ජනතාව වෙත ඇති අයිතිය ඉටුකිරීමක් ලෙස ශ්‍රීපාදස්ථානයෙන් සිදුවන ශාසනික සේවා රැසක් හෙළිදරව් කැරෙන ප්‍රවෘත්ති විශේෂාංගයකි.

## ⌘ නියං සායෙන් බැටකන පීඩිත දනන්ට පිහිට වෙමු

*– කතුවැකිය*

## ⌘ Dialogues on Dhamma

## ⌘ දඹදිව ධර්මදූත මෙහෙවරට අනගාරික ධර්මපාල භාරයෙන් ඇරැයුම්

## ⌘ ශ්‍රී ලංකා - කැනඩා ශිෂ්‍යත්ව පදනමෙන් ශිෂ්‍යාධාර පිරිනැමුණු වගයි.

## ⌘ නියඟයෙන් පීඩා විඳින ජනතාව උදෙසා වූ 'ලේක්හවුස් ප්‍රජා සත්කාර සේවයට' දායක වන්න.

## ⌘ වටද්දර ශ්‍රී සුමනාරාම විහාරය

*– ඩී. ඩබ්ලිව්. චන්ද්‍රසේකර*

ගම්පහ දිස්ත්‍රික්කයට අයත් වේයන්ගොඩ වටද්දර ප්‍රදේශයේ පිහිටි ඉපැරැණි ඓතිහාසික විහාරස්ථානයක් පිළිබඳ තොරතුරු ඇතුළත් ලිපියකි.

## ⌘ ඇමෙරිකාවේ දහම් පහන කුරුණෑගොඩ පියතිස්ස නා හිමි

## ⌘ මහාචාර්ය හාන්දුපැල්පොළ පුඤ්ඤරතන නා හිමි

## ⌘ Ucchanga Jatakaya

*-By Dr. S. G. Samarasingheof Samskrit Research-e-mail - samaskrti@sltnet.lk*